# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2356/26 – 2023 නොවැම්බර් මස 02 වැනි බ්‍රහස්පතින්දා – 2023.11.02

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# III වැනි කොටස – ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

38 වැනි වගන්තිය (ආ) අතුරු විධානය යටතේ ආඥාව

**2023 අංක 218 දරන ආඥාව**

*මගේ යොමු අංකය*: 4-3/18/2019/WS/589.
*ප්‍රාදේශීය ලේකම්ගේ යොමු අංකය*: KDS/KGK/4/2/(4)2019/02/01.

ඉඩම් අත්කර ගැනීමේ පනතේ (460 වැනි පරිච්ඡේදය) 38 වැනි වගන්තියේ (ආ) අතුරු විධානයෙන් මා වෙත පවරා ඇති බලතල අනුව, සංචාරක හා ඉඩම් අමාත්‍ය, නාලක ප්‍රූඩි හරින් ප්‍රනාන්දු වන මම, පහත සඳහන් උපලේඛනයේ 1 වන ඡේදයේ සඳහන් ඉඩම, එම උපලේඛනයේ 2 වන ඡේදයේ අනුරූප සටහනේ විස්තරව ඇති පරවශතාවයට යටත්වන බව මෙම ආඥාවෙන් ප්‍රකාශයට පත් කරමි.

**හරින් ප්‍රනාන්දු,**
සංචාරක හා ඉඩම් අමාත්‍ය.

2023 ඔක්තෝබර් මස 10 වැනි දින,
සංචාරක හා ඉඩම් අමාත්‍යාංශය,
"මිහිකත මැදුර",
අංක 1200/6, රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

උපලේඛනය

1. **ඉඩමේ විස්තරය.**– මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ, මහනුවර කඩවත්සතර සහ ගඟවට කෝරළේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අස්ගිරිය (235) (මහනුවර මහ නගර සභා සීමාව තුළ) ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, අස්ගිරිය ගමේ පිහිටි, සර්වේයර් ජනරාල් විසින් පිළියෙල කරන ලද අංක Maha/MHN/2021/454 හා 2021.12.24 දිනැති ප්‍රගමණ අනුරේඛනයේ සවිස්තරව දැක්වෙන පහත සඳහන් නමින් සහ ප්‍රමාණයෙන් යුක්ත ඉඩම් කැබැල්ලට මායිම්:

2. **පරවශතාවේ විස්තරය.**– මහනුවර උතුර පාතදුම්බර ඒකාබද්ධ ජල සම්පාදන ව්‍යාපෘතියේ අස්ගිරිය බූස්ටර් පොම්පාගාරයේ ප්‍රවේශ මාර්ගය සඳහා විකල්ප ඉඩම් කොටසට පරවශතා අයිතිය අත්කර ගැනීම.

01. **කැබලි අක්ෂර 'A' – නියඳගලේ හේන – ප්‍රමාණය: හෙක්. 0.0072**

උතුරට: විහාරාධිපති, ශ්‍රී විජයසුන්දරාමය, අස්ගිරිය, අයි. අබේසේකර, එස්. අබේසේකර, නන්දා අබේසේකර, නිදා අබේසේකර, පී. පතිරණ, අයි. පතිරණ හිමිකම් කියන නියඳගලේ හේන; නැගෙනහිරට: ශ්‍රී ධම්මදස්සි මාවත; දකුණට: විහාරාධිපති, ශ්‍රී විජයසුන්දරාමය, අස්ගිරිය, අයි. අබේසේකර, එස්. අබේසේකර, නන්දා අබේසේකර, නිදා අබේසේකර, පී. පතිරණ, අයි. පතිරණ හිමිකම් කියන නියඳගලේ හේන; බටහිරට: විහාරාධිපති විජයසුන්දරාමය, අස්ගිරිය, අයි. අබේසේකර, එස්. අබේසේකර, නන්දා අබේසේකර,

නිද්‍රා අබේසේකර, පී. පතිරණ, අයි. පතිරණ හිමිකම් කියන නියඳගලේ හේන.

EOG 11 - 0018

---

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

38 වැනි වගන්තිය (අ) අතුරු විධානය යටතේ ආඥාව

**2023 අංක 228 දරන ආඥාව**

*මගේ අංකය*: 4-3/9/2016/WS/320.
*ප්‍රාදේශීය ලේකම්ගේ යොමු අංකය*: BD/HE/LND/05/60.

ඉඩම් අත්කර ගැනීමේ පනතේ (460 වැනි පරිච්ඡේදය) 38 වැනි වගන්තියේ (අ) අතුරු විධානයෙන් මා වෙත පවරා ඇති බලතල අනුව, සංචාරක හා ඉඩම් අමාත්‍ය, නාලක ජූඩ් හරින් ප්‍රනාන්දු වන මම, පහත සඳහන් උපලේඛනයේ 1 වන ඡේදයේ සඳහන් ඉඩම් අත්කර ගැනීමේ, නිලධාරියාට නැතහොත්, එකී නිලධාරියා විසින් ඒ සඳහා බලය දෙන ලද වෙනත් නිලධාරියෙකුට , එම උපලේඛනයේ 2 වන ඡේදයේ දැක්වෙන නියමිත ඉඩම ස්වාමිත්වයට ගැනීමට මෙයින් නියම කරමි.

**හරින් ප්‍රනාන්දු,**
සංචාරක හා ඉඩම් අමාත්‍ය.

2023 ඔක්තෝබර් මස 10 වැනි දින,
සංචාරක හා ඉඩම් අමාත්‍යාංශය,
"මිහිකත මැදුර",
අංක 1200/6, රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

**උපලේඛනය**

1. **ඉඩම් අත්කර ගැනීමේ නිලධාරි** - ප්‍රාදේශීය ලේකම්, හාලිඇල.

2. **ඉඩමේ විස්තරය**.– ඌව පළාතේ, බදුල්ල දිස්ත්‍රික්කයේ, හාලිඇල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, දෙහිවිනිපළාත කෝරළේ, පල්ලේගම (55-A) ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, ඇටම්පිටිය (අ.ග.පි 197) ගමේ පිහිටි සර්වේයර් ජනරාල් විසින් පිළියෙල කරන ලද අංක B/HLE/2016/409 හා 2017.05.26 දිනැති ප්‍රගමණ අනුරේඛනයේ සවිස්තරව දැක්වෙන පහත සඳහන් නමින් සහ ප්‍රමාණයෙන් යුක්ත ඉඩම් කැබැල්ලට මායිම්:

01. **කැබලි අක්ෂර 'A' – ගොඩමඩිත්ත පතන – ප්‍රමාණය: හෙක්. 0.2023**

උතුරට: කැබලි අංක අ.ග.පි 197 හි $83^{B}$; නැගෙනහිරට: කැබලි අංක අ.ග.පි 197 හි $83^{B}$; දකුණට: කැබලි අංක අ.ග.පි 197 හි $83^{B}$; බටහිරට: කැබලි අංක අ.ග.පි 197 හි $83^{B}$.

EOG 11 - 0020

ශුද්ධි පත්‍රිකාව

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

38 වැනි වගන්තිය (අ) අතුරු විධානය යටතේ ආඥාව

**2023 අංක 86 දරන ආඥාව**

*මගේ අංකය*: 4-3/10/2017/LRB/367.
*ඉඩම් අත්කර ගැනීමේ නිලධාරිගේ යොමු අංකය*: WGSWD&EIP/ACQ/MR/04.

අංක 2334/34 හා 2023.06.01 දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට් පත්‍රයේ* 5A පිටුවෙහි සිංහල භාෂාවෙන් පළ කරන ලද 2023 අංක 86 දරන ලද ආඥාවේ II උපලේඛනයෙ හි කැබලි විස්තරය යටතේ "කැබලි අංක 39 හි ප්‍රමාණය- හෙක්ටයාර 0.3334" යන්න වෙනුවට "කැබලි අංක 39 හි ප්‍රමාණය- හෙක්ටයාර 0.0334" ලෙස ද එම ආඥාවෙහිම 5A පිටුවෙ හි දෙමළ භාෂාවෙන් පළ කරන ලද "කැබලි අංක 39 හි ප්‍රමාණය- හෙක්ටයාර 0.0333" යන්න වෙනුවට "කැබලි අංක 39 හි ප්‍රමාණය- හෙක්ටයාර 0.0334" නිවැරදි විය යුතු බව මෙයින් ප්‍රකාශ කරමි .

**හරින් ප්‍රනාන්දු,**
සංචාරක හා ඉඩම් අමාත්‍ය.

2023 ඔක්තෝබර් මස 10 වැනි දින,
සංචාරක හා ඉඩම් අමාත්‍යාංශය,
"මිහිකත මැදුර",
අංක 1200/6, රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

EOG 11 - 0017

---

ශුද්ධි පත්‍රිකාව

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

38 (අ) අතුරු විධාන ආඥාව

**2023 අංක 29 දරන ආඥාව**

*මගේ අංකය*: 4-3/18/2019/WS/589.
*ප්‍රාදේශීය ලේකම්ගේ යොමු අංකය*: KDS/KGK/4/2/(4)/2019/02/01.

අංක 2324/48 හා 2023.03.24 දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට් පත්‍රයේ* 2A පිටුවෙ හි භාෂාත්‍රයෙන් පළ කරන ලද 38 වැනි වගන්තිය (අ) අතුරු විධානය යටතේ 2023 අංක 29 දරන ආඥාව දෝෂ සහගත ලෙස පළ වී ඇත. එබැවින් අර්ථ නිරූපණ ආඥාපනතේ 18 වගන්තියේ ප්‍රතිපාදන ප්‍රකාරව 2023 අංක 29 දරන ආඥාව මෙයින් අවලංගු කරමි.

**හරින් ප්‍රනාන්දු,**
සංචාරක හා ඉඩම් අමාත්‍ය.

2023 ඔක්තෝබර් මස 10 වැනි දින,
සංචාරක හා ඉඩම් අමාත්‍යාංශය,
"මිහිකත මැදුර",
අංක 1200/6, රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

EOG 11 - 0019

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.